2016 ජූනි 20 දිනැති ඉංග්‍රීසි පිටපත මත මෙම පරිවර්තිත ව.දැ.ප පාදක වේ.

ADB ආසියානු සංවර්ධන බැංකුව

## ශ්‍රී ලංකාව: ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩසටහන

| | |
|---|---|
| ව්‍යාපෘති නාමය | ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩසටහන |
| ව්‍යාපෘති අංකය | 49365-002 |
| රට | ශ්‍රී ලංකාව |
| ව්‍යාපෘති තත්වය | යෝජිත |
| ව්‍යාපෘති වර්ගය/ සහායේ ප්‍රකාරතාව | ණය |
| අරමුදල් මූලාශ්‍රය / වටිනාකම | **ණය: ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩසටහන**<br>සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් — ඇ.එ.ජ ඩොලර් මිලියන 250.00 |
| ක්‍රමෝපාය න්‍යාය පත්‍ර | සමස්ත ආර්ථික වර්ධනය |
| වෙනස්වීමේ තීරක | පරිපාලන සහ ධාරිතා සංවර්ධනය<br>දැනුම් මූල විසඳුම්<br>හවුල්කාරිත්වය<br>පුද්ගලික අංශ සංවර්ධනය |
| ක්ෂේත්‍රය / අනුක්ෂේත්‍රය | **මූල්‍ය-** මුදල් සහ ප්‍රාග්ධන වෙළඳපොළ |
| ස්ත්‍රී/පුරුෂ සමානතාවය සහ මුඛ්‍යධාරාව | ලිංග මූලිකාංග අඩංගු නොවේ |
| විස්තරය | යෝජිත ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩසටහනේ (CMDP) නිශ්චිත අරමුණ වන්නේ ශක්තිමත් නීතිමය සහ නියාමන ආකෘතියක් මත පාදකවූ ප්‍රාග්ධන වෙළඳපොළේ ධාරිතාවය සහ ප්‍රමාණය දියුණු කිරීමයි. ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩසටහන (CMDP) 2016 දෙවැනි කාර්තුවේදී මණ්ඩලය මගින් අනුමත කිරීමට නියමිතය. |
| ව්‍යාපෘති සාධාරණීකරණය සහ දේශීය/ කාලාපීය ක්‍රමෝපාය කෙරෙහි ඇති සම්බන්ධය | ආර්ථිකය තුළ ඉහළ මූල්‍යකරණ අවශ්‍යතාවයක් පැවතියත්, විශේෂයෙන්ම ආයෝජන සහ සංවර්ධන කටයුතු සඳහා සහාය වනු පිණිස පවතින ඉතුරුම් යොමු කිරීමට තරම් ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළඳපොළ ඵලදායීවී නොමැත. පුද්ගලික අංශයට ගලාගිය බැංකු ණයෙහි වාර්ෂික වර්ධනය දළ දේශීය නිෂ්පාදනයෙන් (GDP) 4.1% ක් (ජාතික ඉතුරුම් වලින් 25.4% ක්) වූවත්, 2014 මූල්‍ය වසරේදී හිමිකම් සුරැකුම්පත් සහ ණයකර නිකුතුවෙන් පුද්ගලික අංශය රැස්කරගත් ප්‍රාග්ධනය දළ ජාතික නිෂ්පාදනයෙන් 0.7% ක් පමණි. ආර්ථිකය තවදුරටත් බැංකු මූල්‍යකරණය මත පමණ ඉක්මවා රැඳී පවතී (සමස්ත බැංකු |

| | |
|---|---|
| | අංශයේ වත්කම් ආසන්න වශයෙන් රටේ සමස්ත මූල්‍ය වත්කම් වලින් 60% ක් වේ.). පරිනතවීමේ නොගැලපීම් ගැටළු වැනි ණය අවදානම් වලට බැංකු අංශය යොමුවන බැවින් රටට අවශ්‍ය යටිතල පහසුකම් ආයෝජන මූල්‍යකරණය කිරීම සඳහා බැංකුවලට හැකියාවක් නොමැත. දිගුකාලීන යටිතල පහසුකම් මූල්‍යකරණ අවශ්‍යතා රැස්කිරීමට නොහැකි වන අයුරින් සංයුක්ත බැඳුම්කර වෙළඳපොළ තවමත් ආරම්භක අවධියේ පවතී. අනෙකුත් මැදි ආදායම් ලබන ආසියානු රටවල් වලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ සමස්ත සංයුක්ත බැඳුම්කර වෙළඳපොළ දළ දේශීය නිෂ්පාදනයෙන් 2% ක හෙවත් සැලකියයුතු ලෙස පහළ මට්ටමක පවතී. විශ්වාසනීය රාජ්‍ය ප්‍රතිලාභ වක්‍රයක් සහ ද්‍රවශීල බැඳුම්කර වෙළඳපොළක් ගොඩනැගීමට බාධකයක්ව රජයේ සුරැකුම්පත් මූල්‍යකරණය කිරීමට රක්ෂණ සමාගම්, මෙන්ම විශ්‍රාමික අරමුදල් (විශේෂයෙන්ම සේවක අර්ථසාදක අරමුදල සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල) වලට ඇත්තේ සීමිත අවකාශයකි. එසේම සුරැකුම්පත් හුවමාරුව නියාමනය සහ සමස්ත වෙළඳපොළ සංවර්ධනය ඉක්මවා ඔවුන්ගේ ව්‍යාපාරික අවශ්‍යතා ප්‍රමුඛවන තැරැව්කරුවන් සතුව කොළඹ සුරැකුම්පත් හුවමාරුවේ අයිතිය පවතින අතර එය ඔවුන්ගේ පාලනය යටතේ පවතී. (ප්‍රධාන වෙළඳපොළ යටිතල පහසුකම්ද ඇතුළුව) |
| බලපෑම | මූලික ප්‍රාග්ධන සහ ආයෝජන අවශ්‍යතා සඳහා මෙන්ම ශ්‍රී ලංකාවේ දිගුකාලීන ආර්ථික අරමුණු සඳහා මනාව ක්‍රියාත්මක වන්නාවූ මූල්‍ය පද්ධතියක් සහාය වේ. |
| ප්‍රතිඵලය | ප්‍රාග්ධන වෙළඳපොළ ධාරිතාවය සහ ප්‍රමාණය ඉහළ නැන්වීම |
| නිමැවුම | නීතිමය සහ නියාමන ආකෘතිය ඉහළ නැන්වීම<br>බැඳුම්කර වෙළඳපොළ සංවර්ධනය<br>මූල්‍ය උපකරණ බඳු ප්‍රතිපත්ති සංවර්ධනය<br>ව්‍යුත්පන්න සැකසීම සඳහා පහසුකම් සලසන පරිසරයක්<br>රක්ෂණ ක්ෂේත්‍රය සහ විශ්‍රාම ක්ෂේත්‍රය සංවර්ධනය |
| භූගෝලීය පිහිටීම | |

**ආරක්ෂණ වර්ගීකරණයන්**

| | |
|---|---|
| පරිසරය | C |
| ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම | C |
| ආදිවාසී ජනතාව | C |

**පාරිසරික සහ සාමාජයීය අංග පිළිබඳ සාරාංශය**

| |
|---|
| පාරිසරික අංගය |
| ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම |

ආදිවාසී ජනතාව

| |
|---|
| **පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය, සහභාගිත්වය සහ උපදේශනය** |
| ව්‍යාපෘති සැලසුම්කරණ කාලය අතරතුර |
| ව්‍යාපෘතිය ක්‍රියාවට නැන්වීම අතරතුර |

**ව්‍යාපාරික අවස්ථාවන්**

| | |
|---|---|
| ප්‍රසම්පාදනය | ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන සාම්ප්‍රදායික ප්‍රසම්පාදනයන් බලාපොරොත්තු නොවේ. දකුණු ආසියානු රාජ්‍ය කළමනාකරණ මූල්‍ය සහ වෙළඳ කොට්ඨාශයේ (SAPF's) B බාණ්ඩයේ ප්‍රසම්පාදන වර්ගීකරණය සමඟ එකඟ වේ. |

**වගකිව යුතු නිළධාරී**

| | |
|---|---|
| ආ.ස.බැ වගකිව යුතු නිළධාරී | ස්යේද් සහා |
| ආ.ස.බැ වගකිව යුතු දෙපාර්තමේන්තුව | දකුණු ආසියා දෙපාර්තමේන්තුව |
| ආ.ස.බැ වගකිව යුතු අංශය | පොදු කළමනාකරණය, මූල්‍ය අංශ සහ වෙළඳ දෙපාර්තමේන්තුව<br>දකුණු ආසියානු රාජ්‍ය කළමනාකරණ මූල්‍ය සහ වෙළඳ කොට්ඨාශය |
| ක්‍රියාවට නැන්වීමේ නියෝජිත ආයතන | **මූල්‍ය සහ සැලසුම්කරණ අමාත්‍යාංශය**<br>තැපැල් පෙට්ටිය 277<br>මහා ලේකම් කාර්යයාල ගොඩනැගිල්ල<br>කොළඹ 01, ශ්‍රී ලංකාව<br><br>**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**<br>1 වන මහල, ''මිලෝදා''<br>බ්‍රිස්ටල් වීදිය<br>කොළඹ 01, ශ්‍රී ලංකාව |

**කාලසටහන**

| | |
|---|---|
| සංකල්ප අනුමත කිරීම | 2016 අප්‍රේල් 29 |
| තොරතුරු සෙවීම | 2016 ජූනි 06 සිට 2016 ජූනි 06 |
| කළමණාකරණ සමලෝචන රැස්වීම | 2016 ජූලි 06 |
| අනුමැතිය | 2016 සැප්තැම්බර් 29 |
| අවසන් විමර්ශණ මෙහෙවර | - |
| ව්‍යාපෘති දත්ත පත්‍රය අවසන් වරට යාවත්කාලීන කරන ලද්දේ | 2016 අප්‍රේල් 26 |

ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධ සාරාංශගත කරන ලද තොරතුරු ව්‍යාපෘති දත්ත පත්‍රවල අඩංගු වේ. ව්‍යාපෘති දත්ත පත්‍රිකාවක් යනු වැඩ කෙරෙමින් පවතින ව්‍යාපෘති සම්බන්ධ වාර්තාවක් බැවින් ඇතැම් තොරතුරු මෙහි පළමු පිටපත් වල ඇතුළත් නොවිය හැකි අතර එකී තොරතුරු ලැබෙන පරිදි ඇතුලත් කරනු ඇත. යෝජිත ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු තාවකාලික සහ හඟවන තොරතුරු වේ.

ආසියානු සංවර්ධන බැංකුව විසින් මෙම ව්‍යාපෘති දත්ත පත්‍රයේ සඳහන් තොරතුරු එය භාවිත කරන්නන් සඳහා උපකරණයක් ලෙස භාවිතා කිරීමට කිසිදු සහතිකවීමක් නොමැතිව සපයයි. ආසියානු සංවර්ධන බැංකුව විසින් ඉහළ ගුණත්වයෙන් යුත් අන්තර්ගතයක් සැපයීමට සෑම විටම උත්සහ කරන අතර කිසිදු ආකාරයක වගකීමක් නොමැතිව, ප්‍රකාශිතව හෝ හැඟවීමෙන්, පණ්‍යයීය ආකාරයේ වගකීම් සීමාකම් නොමැතිවීම ඇතුළත්ව, නිශ්චිත අරමුණක් සඳහා ගැළපෙන පරිදි, උල්ලංඝනය නොවන ලෙස තොරතුරු "පෙනෙන පරිදි" සපයයි. මෙවන් ඕනෑම තොරතුරක නිරවද්‍යතාවය හෝ පරිපූරත්වය පිළිබඳව ආසියානු සංවර්ධන බැංකුව විසින් විශේෂිතව ඕනෑම වගකීමක් සහ පෙනීසිටීමක් සිදුනොකරයි.